සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම
Second term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- .................................................................................. විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:
*** I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**
*** II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**

## I කොටස

❖ **අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අතීතයේ බානුවාපි නමින් හඳුන්වා ඇති වැව වර්තමානයේ හඳුන්වන්නේ කුමන නමින් ද?
(1) මහකනදරා වැව (2) කලා වැව
(3) මහවිලච්චිය වැව (4) මාදතුගම වැව

(02) දිවයිනේ මහවැව් ඉදිකිරීමේ පුරෝගාමියා ලෙස ගෞරවාදරයට පත්වූ රජතුමා කවුරුන් ද?
(1) දේවානම්පියතිස්ස රජතුමා (2) ධාතුසේන රජතුමා
(3) වසභ රජතුමා (4) මහසෙන් රජතුමා

(03) ස්ථාවර වේල්ලක් සහිත පුරාණ අමුණකට හොඳම නිදසුන වන්නේ,
(1) ඇළහැර අමුණ (2) තේක්කම් අමුණ
(3) මිනිපේ අමුණ (4) හත්තොට අමුණ

(04) වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා ඉදිකර ඇති නිර්මාණය වන්නේ,
(1) රළපනාව (2) සොරොච්ච (3) බිසෝකොටුව (4) පිටවාන

(05) පද්මස්වර නමින් උයනක් තනවා ඇති රජතුමා කවුරුන් ද?
(1) මුටසීව රජු (2) කුටකණ්ණතිස්ස රජු
(3) පළමුවන කාශ්‍යප රජු (4) පළමුවන අග්බෝ රජු

(06) පැරණි ගඩොල්වල ශක්තිමත් භාවය නොඉක්මවා යන ප්‍රමිතියකින් යුතුව ගඩොල් නිෂ්පාදනය කර මෑතක දී සංරක්ෂණය කළ දාගැබ මින් කුමක් ද?
(1) අභයගිරි දාගැබ (2) ථූපාරාම දාගැබ
(3) රුවන්මැලි දාගැබ (4) ජේතවන දාගැබ

(07) මහනුවර රාජධානියට ඇතුළුවීමට හැකිවූ දුර්ගමාර්ග දෙක සඳහන් පිළිතුර තෝරන්න.
(1) ගලගෙදර, පිළිමතලාව (2) බලන, පේරාදෙනිය
(3) හන්තාන, උඩවත්ත (4) බලන, හුන්නස්ගිරිය

(08) - උඩරට අලුත් රජ පෙළපතක් ආරම්භ වීම
- දෙල්ගමුව විහාරයේ සඟවා තිබූ දළදාව උඩරටට වැඩම කරවීම
ඉහත කරුණු හා සම්බන්ධ රජතුමා වන්නේ,

(1) පළමුවන විමලධර්මසූරිය රජු
(2) පළමුවන රාජසිංහ රජු
(3) දෙවන විමලධර්මසූරිය රජු
(4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

(09) කලාත්මක ලී කැටයම් නිර්මාණ දක්නට ලැබෙන ස්ථානයක් වන්නේ,

(1) මැදවෙල ටැම්පිට විහාරය
(2) ලංකාතිලක විහාරය
(3) ඇම්බැක්කේ දේවාලය
(4) ගඩලාදෙනි විහාරය

(10) - පහතරට ප්‍රදේශවල සිටි ලන්දේසීන් සමඟ සුහදව කල් ගෙවීම
- බුරුමයෙන් උපසම්පදාව ගෙන්වීම හා දළදා මාළිගය ප්‍රතිසංස්කරණය කිරීම
ඉහත කාර්යයන් හා සම්බන්ධ රජතුමා කවුරුන් ද?

(1) දෙවන විමලධර්මසූරිය රජු
(2) දෙවන රාජසිංහ රජු
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(4) රාජාධිරාජසිංහ රජු

(11) ''අ'' තීරුව සමඟ ''ආ'' තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. අන්තිම රාත්‍රී භෝජනය | A - ගැලිලියෝ ගැලිලි |
| 2. අවසාන විනිශ්චය | B - මයිකල් ආන්ජිලෝ |
| 3. ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව | C - ඩොනෙටෙලෝ |
| 4. දුරේක්ෂය නිපදවීම | D - ලියනාඩෝ ඩාවින්චි |

(1) ABCD (2) DBAC (3) BDCA (4) DBCA

(12) පුනරුද සමයේ බිහිවූ වෙළඳ නගරයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) වැනීසිය (2) ජිනෝවා (3) ප්ලෝරන්ස් (4) පාදුවා

(13) සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල ඉලිප්සාකාරව සූර්යයා වටේ ගමන් කරන බව සොයාගන්නේ ලද්දේ,

(1) නිකලස් කොපර්නිකස් ය.
(2) ජොහැන්නස් කෙප්ලර් ය.
(3) අයිසෙක් නිව්ටන් ය.
(4) ගැලිලියෝ ගැලිලි ය.

(14) පෘතුගීසීන් අන්ත පරාජයට පත්වූ ගන්නොරුව සටන මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා කවුරුන් ද?

(1) ජෙරෝලෝපෙස්ද සූසා
(2) ජෙරනිමෝ ද අසවේදු
(3) දියෝ ගුද මෙලෝ
(4) කොන්ස්තන්තීනුද සා

(15) සේනාසම්මත වික්‍රමබාහු රජතුමා සම්බන්ධ පහත ප්‍රකාශනවලින් නොගැළපෙන වගන්තිය තෝරන්න.

(1) මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා ය.

(2) මෙම රජුගෙන් පසු ජයවීර බණ්ඩාර රාජ්‍යත්වයට පත්විය.

(3) ජෝතිය සිටුවරයාගේ කැරැල්ලට සාර්ථකව මුහුණ දී ජය ගත්තේ ය.


(4) කෝට්ටේ පාලන බලයෙන් සෙංකඩගල නිදහස් කර ගත්තේ ය.

(16) මධ්‍යතන යුගය අවසානයේ ඉතාලියේ බිහිවූ විශ්ව විද්‍යාලයක් වන්නේ,

(1) බොලොඤ්ඤා (2) පැරිස්

(3) ඔක්ස්පර්ඩ් (4) කේම්බ්‍රිජ්

❖ **අංක 17 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ලංකා සිතියම උපයෝගී කර ගනිමින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**




(17) "A" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති වැව කුමක් ද?

(1) මින්නේරිය වැව (2) කලා වැව

(3) නාච්චදූව වැව (4) යෝධ වැව

(18) "B" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ගංගාව කුමක් ද?

(1) මල්වතු ඔය (2) කලා ඔය

(3) දැදුරු ඔය (4) යාන් ඔය

(19) "C" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ඓතිහාසික නගරය කුමක් ද?

(1) අනුරාධපුරය (2) ගම්පොළ

(3) මහනුවර (4) දඹදෙණිය

(20) "D" අක්ෂරයෙන් පෙන්වා ඇති ඓතිහාසික නගරයේ පිහිටි පොකුණක් වන්නේ මින් කුමක් ද?

(1) කුට්ටම් පොකුණ (2) නෙළුම් පොකුණ

(3) ඇත් පොකුණ (4) රජගල පොකුණ

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (I) පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(අ) (i) A පින්තූරයෙන් දැක්වෙන රජතුමා කවුරුන්දැයි නම් කරන්න.

(ii) මොහු කුමන රාජවංශයට අයත් ද?

(iii) මොහු රජකමට පත් කිරීමට කටයුතු කළ මහාධිකාරම්ගේ නම කුමක් ද?

(iv) මෙම රජතුමා විසින් සිදුකළ එක් වැදගත් සේවාවක් ලියන්න.

B



(ආ) (i) B පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(ii) මෙය කුමන ආගමක් හා සම්බන්ධ ද?

(iii) මෙය දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ කුමන ඓතිහාසික නගරයේ ද?

(iv) මෙහි දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ශෛලිය කුමක් ද? (ලකුණු 2 x 8 = 16)

(02) (i) වසභ රජතුමා විසින් තනවන ලදැයි සැලකෙන වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අතීතයේ ඇළවල් තැනවීමේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහවැව් තැනවීමේ දී මුහුණ දුන් අභියෝග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) අතීතයේ මෙරට යකඩ නිස්සාරණය කළ බවට පැහැදිලි සාක්ෂි හමුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝහ කර්මාන්තයේ නියැලුණු පහත සඳහන් පුද්ගලයින් සෙල්ලිපිවල හඳුන්වා තිබූ නම් පිළිවෙළින් ලියා දක්වන්න.

(a) ලෝහ වැඩ කරන්නා (b) බෙලෙක් වැඩ කරන්නා (ලකුණු 04)

(iii) අතීතයේ මෙරට රන් කර්මාන්තය ඉතා දියුණු මට්ටමක පැවති බව නිදසුන් දෙකක් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) උඩරට රාජධානිය හැඳින්වීමට භාවිතා කළ වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුදු දහමේ උන්නතියට විශාල සේවාවක් ඉටුකළ බවට උදාහරණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) මහනුවර යුගයේ චිත්‍ර කලාවේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(05) (i) උඩරට රාජධානි සමයේ මෙරටට ආනයනය කළ වෙළඳ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත යටතේ දක්වා ඇති තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - සිංහල රජ පෙළපතේ අවසන් රජතුමා

B - කුසුමාසන දේවිය විවාහ කරගෙන රාජ්‍යත්වයේ නීත්‍යානුකූල උරුමය තහවුරු කරගත් රජතුමා

C - පොළොන්නරුවේ රන්කොත් වෙහෙර තැනූ රජතුමා

D - ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගන්නා විට උඩරට පාලකයා

(ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ සමාජ ක්‍රමය සකස් වී පැවැති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහිවූ පහත සඳහන් විශ්ව විද්‍යාල පිහිටි රටවල් පිළිවෙළින් ලියා දක්වන්න.

A. බොලොඤ්ඤා B. කේම්බ්‍රිජ් (ලකුණු 02)

(ii) පුනරුද සමයේ බිහිවූ කලා ශිල්පවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) පුනරුද සමයේ බිහිවූ ගත් කතුවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. විලියම් හාවේ

B. වෛද්‍ය පැරසල්සස් (ලකුණු 04)

(iii) පුනරුද සමයේ ඇතිවූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)